02060

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය (1 වන අදියර)
**STP 8301/ STP 8501/ ESP 2201** - අධ්‍යාපන මනෝවිද්‍යාව
කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.04.26 වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

01 වන කොටසේ **සියලුම** ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද **(03)** පිළිතුරු සපයන්න.

## 01 - වන කොටස

01. අධ්‍යාපන මනෝවිද්‍යාව යන සංකල්පය පිළිගත හැකි නිර්වචන දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න.

02. පර්යේෂණාත්මක නොවන ළමා අධ්‍යයන ක්‍රමයක් නම් කර එහි ප්‍රබලතා හා දුර්වලතා කෙටියෙන් විස්තර කරන්න.

03. "පුද්ගල සංවර්ධනයේ එක් අංශයක හිතකර සංවර්ධනයක් ඒ හා සමාන ආකාරයකින් සංවර්ධනයේ අනෙකුත් සියලුම අංශ කෙරෙහි හිතකර බලපෑමක් ඇති කළ හැකිය." උදාහරණයක් දෙමින් මෙම වගන්තිය සාධාරණීකරණය කරන්න.

04. ළමාවියේදී දරුවෙකුගේ බුද්ධිමය සංවර්ධනයට පහසුකම් සැලසීමේ දී ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයාගේ කාර්යභාරය උදාහරණ දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න.

05. බැන්ඩූරාගේ නිරීක්ෂණ ඉගෙනුම් න්‍යායේ මූලධර්මවලට අනුකූලව පන්තිකාමරය තුළ භාවිත කළ හැකි ඉගෙනුම් - ඉගැන්වීම් උපායමාර්ග දෙකක් **(02)** පැහැදිලි කරන්න.

06. පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යාය මත පදනම්ව ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණි සඳහා යෝග්‍ය අධ්‍යාපනික භාවිතයන් දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න.

07. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන් පෙළඹවීම සඳහා අවශ්‍යතා ධූරාවලිය පිළිබඳ මාස්ලෝගේ න්‍යායයේ මූලධර්මවලට අදාළව ගුරුවරයාගේ භූමිකාව උදාහරණ දෙකක් **(02)** උපුටා දක්වමින් පැහැදිලි කරන්න.

08. දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා පාසලට දායක විය හැකි ආකාර දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05x08=40)

<u>02 - වන කොටස</u>

09. (i.) "දරුවෙකුගේ සංවර්ධනයට ආරය සහ පරිසරය යන සාධක දෙකම බලපායි." උදාහරණයක් දක්වමින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 04)

(ii.) දරුවන්ගේ චිත්තවේගීය සංවර්ධනයට බලපාන සාධක දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii.) සුදුසු උදාහරණ දෙකක් **(02)** බැගින් දක්වමින් දරුවන්ගේ චිත්තවේගීය සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා දෙමාපියන්ගේ සහ පාසලේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 12)

10. (i.) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා සිසුන් පෙළඹවීමේ වැදගත්කම උදාහරණ දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) පෙළඹවීම (අභිප්‍රේරණය) පිළිබඳ මානවීය ප්‍රවේශ අතරින් එක් න්‍යායක මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii.) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී සිසුන් පෙළඹවීම සඳහා ගුරුවරයාට ඉහත සඳහන් මානවීය ප්‍රවේශයේ මූලධර්ම භාවිත කළ හැකි ක්‍රම තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු 12)

11. (i.) විවිධාකාර ඉගෙනුම්ලාභීන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ගුරුවරයෙකු විසින් සළකා බැලිය යුතු සාධක දෙකක් **(02)** උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) හෝවාඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යායයේ මූලධර්ම පිළිබඳ දැනුම දරුවන්ගේ විවිධ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ගුරුවරයෙකුට වැදගත් වන්නේ කෙසේදැයි කරුණු දෙකක් **(02)** උපුටා දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iii.) ඔබගේ විෂයයේ තෝරාගත් පාඩමක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන්ගේ විවිධ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා භාවිත කළ හැකි උපායමාර්ග හතරක් **(04)** සාකච්ඡා කරන්න. (ලකුණු 12)

12. (i.) "සිසුන්ගේ ඉගෙනීමට පහසුකම් සැලසීම සඳහා ගුරුවරයාට විවිධ ඉගෙනුම් න්‍යායන් පිළිබඳ පුළුල් අවබෝධයක් තිබිය යුතුයි." මෙම ප්‍රකාශය උදාහරණ දෙකක් **(02)** මගින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 04)

(ii.) ශිෂ්‍ය ඉගෙනුම පැහැදිලි කිරීමේ දී ප්‍රජානන න්‍යායන් (Cognitive theories) සහ නිර්මාණාත්මක න්‍යායන් (Constructivist theories) අතර සමානකම් සහ වෙනස්කම් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iii.) ඉගෙනුම පිළිබඳ නිර්මාණවාදීන්ගේ අදහස් මත (constructivist's' views) පදනම්ව, ද්විතියික පාසල් දරුවන්ගේ ප්‍රජානන සංවර්ධනය පහසු කිරීම සඳහා ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි උපායමාර්ග හතරක් **(04)** විභාග කරන්න. (ලකුණු 12)

13. (i.) ළමා සහ නව යොවුන්වියේ ප්‍රජානන සංවර්ධනයේ සංවර්ධන ලක්ෂණ අතර ඇති වෙනස්කම් දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) වර්තමාන ශ්‍රී ලාංකික සන්දර්භය තුළ දී නව යෞවනයන් මුහුණදෙන දුෂ්කරතා දෙකක් **(02)** සුදුසු උදාහරණ සපයමින් විස්තර කරන්න. (ලකුණු 04)

(iii.) ඔබේ පාසලේ නව යොවුන් වියේ දරුවන්ට ඉහත සඳහන් කළ දුෂ්කරතා මඟහරවා ගැනීමට ඔබ පහසුකම් සපයන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 12)

14. (i.) පෞරුෂ සංවර්ධනය පිළිබඳ දැනුම ගුරුවරයෙකුට වැදගත්වන්නේ මන්දැයි උදාහරණ දෙකක් **(02)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(ii.) කාල් යුන්ග් (Carl Jung) ගේ අදහස්වලට අනුව පෞරුෂ සංවර්ධනය සිදුවන අකාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 04)

(iii.) මනා සමායෝගී පෞරුෂයන් සිසුන් තුළ සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 12)

*- සියලුම හිමිකම් ඇවිරිණි. -*